ලංකාදීප 2022 පෙබරවාරි මස 14 වැනිදා සඳුදා

# මහ කොමසාරිස් මොරගොඩ ඉන්දීය මුදල් ඇමැතිනිය හමුවෙයි



ඉන්දියාවේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් මිලින්ද මොරගොඩ මහතා ඉන්දියාවේ මුදල් හා ආයතනික කටයුතු අමාත්‍ය නිර්මලා සීතාරාමන් මහත්මිය නවදිල්ලි නුවරදී හමු වූ අතර, ද්විපාර්ශ්වික ආර්ථික සහයෝගිතාවයේ කොටසක් වන අත්‍යවශ්‍ය භාණ්ඩ මිලදී ගැනීම සඳහා වන ඇමෙරිකානු ඩොලර් බිලියනයක ණය පහසුකම ඉක්මනින් ලබාගැනීමට ඇති හැකියාව පිළිබඳව එහිදී අවධානය යොමු කර ඇත.

ශ්‍රී ලංකාව පසුවන මෙම තීරණාත්මක අවස්ථාවේදී ආර්ථිකය නගාසිටුවීම සඳහා සහාය දැක්වීමට දක්වන පෞද්ගලික උනන්දුව පිළිබඳව ඉන්දීය මුදල් අමාත්‍යවරියට මහ කොමසාරිස්වරයා සිය ස්තුතිය පුද කළේය.

පසුගිය වසරේ දෙසැම්බර් මාසයේදී ශ්‍රී ලංකා මුදල් අමාත්‍ය බැසිල් රාජපක්ෂ මහතාගේ ඉන්දීය සංචාරයේදී එකඟ වූ පරිදි අංශ හතරකින් යුතු සහයෝගිතාවයේ කොටසක් වන මෙම පහසුකම ගැන ඉකුත් ජනවාරි 18 වැනිදා මුදල් අමාත්‍යවරයා සහ ඉන්දීය විදේශ කටයුතු අමාත්‍ය ආචාර්ය එස්. ජයශංකර් අතර පැවැති අන්තර්ජාල හමුවකදී ද සමාලෝචනයට ලක්කරනු ලැබීය.